**පළාත් පාලන ආයතන විසින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති වලට අදාළව නඩත්තු කළ යුතු ලිපි ගොනු වල සෝදිසි ලැයිස්තුව**

| | | A | B |
|---|---|---|---|
| | අනුමත වැඩ යෝජනාව පළාත් පාලන ආයතන මගින් ක්‍රියාත්මක කරන බවට එකඟතාවය ලබා දුන් ලිපිය | | |
| | අනුමත වැඩ යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා එකඟ වන ප්‍රමිතීන් හා රේට් ගණන් වල උපදෙස් සමගින් ඇස්තමේන්තු සකස් කර ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කිරීමට දන්වන ලද ලිපිය. | | |
| | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන වසමේ ආර්ථික සංවර්ධන නිලධාරී සමග පළාත් පාලන ආයතනයේ තාක්ෂණ නිලධාරියෙකු සම්බන්ධ වී සකස් කරනු ලබන පූර්ව විමර්ශන වාර්තාව. | | |
| | පළාත් පාලන ආයතනයෙන් සකස් කරන ලද, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තාක්ෂණ නිලධාරීන් පරීක්ෂා කිරීමෙන් අනතුරුව ප්‍රාදේශීය ලේකම් අනුමත කරන ලද ව්‍යාපෘති ඇස්තමේන්තුවේ පිටපතක් සමඟ ඇස්තමේන්තුව අනුමත කළ බව පළාත් පාලන ආයතන වෙත දන්වා යැවූ ලිපියේ පිටපත | | |
| | ප්‍රාදේශීය ලේකම් විසින් අනුමත කරනු ලැබූ, ඇස්තමේන්තුවට අනුකූල වන අන්දමින් සකස් කළ අවබෝධතා ගිවිසුම සම්පූර්ණ කර දෙපාර්ශ්වය විසින් අත්සන් තබා ඇත. | | |
| | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදාළ අනෙකුත් උපදෙස් සමඟින් අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුමේ පිටපතක් පළාත් පාලන ආයතනය වෙත යවා ඇත. | | |
| | පළාත් පාලන ආයතනය විසින් වැඩ යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා පවරන ලද කොන්ත්‍රාත්කරු සමඟ අත්සන් කරන කොන්ත්‍රාත් ගිවිසුමේ පිටපතක් හා ගිවිසුම් දෙපාර්ශ්වයන් විසින් අත්සන් කරන ලද ප්‍රමාණ පත්‍ර වල පිටපත් ලබා ඇත. | | |
| | ව්‍යාපෘතියේ ඉදිකිරීම් සිදු කරන අවස්ථාවලදී අධීක්ෂණ කටයුතු සිදු කිරීම සඳහා වසම භාර ආර්ථික සංවර්ධන නිලධාරී වෙත දැනුම් දී ඇත. | | |
| | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව ඉටු කළ වැඩසටහන සඳහා වන බිල් පත්‍රය, ක්ෂේත්‍රයේ ලොග් සටහන් පත්‍රය, අදාළ වේ නම් තත්ත්ව පරීක්ෂණ වාර්තාව ලබා දී ඇත. | | |
| | ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අධීක්ෂණය සිදු කරන ලද වසම භාර ආර්ථික සංවර්ධන නිලධාරීගේ වාර්තාව ලබා දී ඇත. | | |
| | ඉදිරිපත් කර ඇති බිල් පත්‍රය, අනුමත කළ ඇස්තමේන්තුවේ සඳහන් ප්‍රමිතීන් හා රේට් ගණන් යොදා සකස් කර ඇති බවට හා එහි දැක්වෙන ගණනය කිරීම් නිවැරදි බවට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තාක්ෂණික නිලධාරිය පරීක්ෂා කර නිර්දේශ කර ඇත. | | |
| | ගිවිසුම් කාලය ඉකුත් වී ඇත්නම් කාලය දීර්ඝ කිරීමේ ලිපිය නිකුත් කර ඇත. එසේ නොවේ නම් ප්‍රමාද ගාස්තු අය කිරීමට කටයුතු කර ඇත. | | |
| | ගෙවීම් සඳහා සම්පූර්ණ කරන ලද පොදු 35 වවුචර් පත්‍රයේ දැක්වෙන වටිනාකම වැඩ, මැනුම්පත් වල දැක්වෙන වටිනාකම හා සමාන වේ. | | |
| | ගෙවීම් සඳහා සකස් කරන ලද පොදු 35 වවුචර් පත්‍රය නියමිත බලය ඇති නිලධාරීන් විසින් පිළියෙල කර පරීක්ෂා කර නිර්දේශ කර අනුමත කර ඇත. | | |
| | කොන්ත්‍රාත්කරු භාරයේ නඩත්තු කරන ලද, ව්‍යාපෘතිය අධීක්ෂණය කරන නිලධාරීන්ගේ සටහන් ඇතුළත් ලොග් සටහන් පත්‍රය කොන්ත්‍රාත්කරුගෙන් ලබාගෙන ගොනු කර ඇත. | | |
| | ගෙවීම් සඳහා පිළියෙල කරන ලද පොදු 35 වවුචරයේ හා රඳවුම් මුදල සඳහා සකස් කළ මුදල් බඳින වවුචරයේ (PIV) වල කාර්යාල පිටපත ගොනු කර ඇත | | |
| | පළාත් පාලන ආයතනය විසින් නඩත්තු කාලසීමාව අවසානයේ ව්‍යාපෘතිය සම්බන්ධ තාක්ෂණික වාර්තාව ලබාගෙන ඇත. | | |
| | තාක්ෂණික වාර්තාවේ ව්‍යාපෘතිය පිළිබඳ අඩුපාඩු දක්වා ඇත්නම් ඒවා නිවැරදි කිරීමට කොන්ත්‍රාත්කරුට දන්වා ඇත. | | |
| | තාක්ෂණික වාර්තාවේ අඩුපාඩු නැත්නම් / තිබූ අඩුපාඩු කොන්ත්‍රාත් කරු විසින් සම්පූර්ණ කර ඇත්නම්, රඳවුම් මුදල් ගෙවීම සඳහා කටයුතු කර ඇත. | | |

**A විෂය ගොනුව පවත්වාගෙන යන**
**කළමනාකාර සහකාර**
නම : ....................................................
අත්සන : ...........................................
නිවැරදි බව සහතික කරමි.
සහකාර අධ්‍යක්ෂ : ...............................

**B ගොනුව පරීක්ෂා කළ කලාප භාර**
**ආර්ථික සංවර්ධන නිලධාරී**
නම : .......................................................
අත්සන : ..................................................
දිනය : .....................................................

❖ මෙම සෝදිසි ලැයිස්තුව කොන්ත්‍රාත් ගොනුවේ මුල් පිටකවරයේ ඇතුළු පැත්තට අමුණා, ඒ ඒ කාර්යයන් සම්පූර්ණ කරන අවස්ථාවලදී "√" ලකුණින් සම්පූර්ණ කර ගොනුව සමග පවත්වාගෙන යාමට කටයුතු කළ යුතු අතර ව්‍යාපෘතිය සඳහා රඳවුම් මුදල් ගෙවා අවසන් වූ පසු මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් කටයුතු කළ කළමනාකාර සහකාර හා කලාප භාර ආර්ථික සංවර්ධන නිලධාරී තමන් විසින් ඉටු කරන ලද කාර්යයන් සෝදිසි ලැයිස්තුව අවසානයේ ඇති ඔවුන් සඳහා වෙන් කළ කොටසේ නම හා අත්සන යොදා සනාථ කළ යුතුවේ.

KOT/DEV/01/FO/GEN/11/III